**බීඕසී ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017**

------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බීඕසී ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව සමාගමේ මෙහෙයුම් පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය")වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

--------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය

---------

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

--------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, පහත දෑ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය නම්,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බව,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල බව.

### 2.2 නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | සමාගම විසින් මුළු ආදායම මත නොව ලාභ ආන්තිකය මත ජාතිය ගොඩනැගීමේ බදු ගෙවා තිබුණි. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | (i) 2017 වර්ෂය සඳහා සමාගම විසින් යෙදවුම් මත රු.764,079 ක එකතු කිරීමේ බදු පිරිවැටුමෙන් අඩු නොකිරීම හා එය පරිපාලන වියදමක් සේ සලකා තිබුණි.<br>(ii) බදු ගෙවිය යුතු සැපයුම මත එකතු කළ අගය මත බදු වගකීම ගණනය කළ යුතු වුවත්, ලාභ ආන්තිකය මත බදු වගකීම ගණනය කර තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 20 වැනි වගන්තියේ උප ජේද (6) | රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ වෙනත් රජයේ සංස්ථාවලට බදු ඉන්වොයිසි සමාගම විසින් නිකුත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය බදුවලට පෙර රු.මිලියන 30.31 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර රු.මිලියන 33.29 ක ශුද්ධ ලාභයක් වූ අතර එය රු.මිලියන 2.98 ක හෙවත් සියයට 8.95 ක මූල්‍ය ප්‍රතිඵලවල පිරිහීමක් නිරූපනය විය. විකුණුම් ආදායම රු.මිලියන 2.20 කින් හා වෙනත් ආදායම් රු.මිලියන 9.20 කින් පසුගිය වර්ෂය හා සැසඳීමේදී අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට විශේෂයෙන් ප්‍රධාන හේතුව වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමහර වැදගත් අනුපාත පසුගිය වර්ෂ 4 සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාතය | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| **ලාභදායීත්ව අනුපාතය (සියයට)** | | | | | |
| ශුද්ධ ලාභ අනුපාතය | 2 | 2.3 | 3.0 | 2.6 | 3.9 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය | 10 | 11 | 15 | 15 | 20 |
| ස්කන්ධය මත ප්‍රතිලාභය | 13.4 | 15.7 | 21 | 19.5 | 26.7 |
| **ක්‍රියාකාරී අනුපාත** | | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 16 | 12 | 19 | 17 | 15 |
| ණයගැති පිරිවැටුම් කාලය (දින) | 23 | 29 | 19 | 21 | 23 |
| ද්‍රවශීලතා අනුපාත (වාර ගණන) | | | | | |
| ජංගම අනුපාතය | 4.44 | 3.53 | 3.83 | 4.7 | 4.26 |
| මුළු වත්කම් මත ශුද්ධ ජංගම වත්කම් | 0.73 | 0.67 | 0.70 | 0.72 | 0.69 |

(අ) සමාගමේ ලාභදායීත්වය පසුගිය වර්ෂ 5 තුළ උග්‍ර ලෙස පහත වැටී තිබුණි.

(ආ) සමාගමේ ද්‍රවශීලතා අනුපාතය පිළිගත හැකි මට්ටමට වඩා ඉහළ මට්ටමක තිබුණි. එය සමාගමේ කාරක ප්‍රාග්ධනය සතුටුදායක මට්ටමකින් කළමනාකරණය කර නොතිබුණු බව පිළිඹිබු විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්ම සමාගම විසින් පිළියෙල කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 වර්ෂය තුළ නිකුත් කරන ලද ගුවන් ප්‍රවේශපත් සංඛ්‍යාව පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 4.6 කින් අඩු වී තිබුණි.

(ii) පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංචාරකයන්ගේ දේශීය චාරිකා (inbound tours) උග්‍ර ලෙස සියයට 387 කින් වැඩි වී තිබුණි. කෙසේ නමුත් සංචාරකයන්ගේ විදේශීය චාරිකා (outbound tours) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සියයට 47 කින් අඩු වී තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

(අ) රු.97,044,447 ක මුළු ණයගැති ශේෂයෙන් රු.62,998,432 ක් නොහොත් සියයට 65 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු මුදල් නියෝජනය විය. ණය ප්‍රතිපත්ති අත්පොත ප්‍රකාරව රජයේ ආයතනවලට දින 60 ක ණය කාලයක් දී තිබුණ වුවත්, දී තිබුණු ණය කාලසීමාව තුළ හිඟ හිටි ශේෂ අයකර ගැනීමට සමාගම අසමත් වී තිබුණි. 2017 වර්ෂය තුළදී ලියාහරින ලද රු.1,950,687 ක මුදලින් රු.1,794,632 ක් නොහොත් සියයට 92 ක් රජයේ ආයතනවලින් ලැබිය යුතු මුදල් නියෝජනය විය.

(ආ) දඹදිව චාරිකා සඳහා හෝටල් පහසුකම් සැපයීම, ආහාර, ප්‍රවාහන හා මඟ පෙන්වීම් ආදියට ඉන්දියන් ප්‍රවාහන නියෝජිත ආයතනයකගේ සේවය සමාගම විසින් ලබාගෙන තිබුණි. දෙපාර්ශවයේ කාර්යයන් හා වගකීම් සම්බන්ධයෙන් ඉහත සඳහන් ප්‍රවාහන නියෝජිත ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) දඹදිව චාරිකාවල වෛද්‍ය හා අනතුරු අවදානම ආවරණය කිරීමේ පරමාර්ථයෙන් සමාගම විසින් ඔරියන්ටල් රක්ෂණ සමාගමින් ප්‍රවාහන රක්ෂණ ඔප්පුවක් ලබාගෙන තිබුණි. කෙසේ වුවත් සමාගම විසින් ඉහත සඳහන් රක්ෂණ සමාගම සමඟ එළඹ තිබුණු ගිවිසුම 2015 ජුලි 10 දින කල්පිරී තිබුණු අතර මෙම වාර්තාවේ දින වන විටත් එය දීර්ඝ කරගෙන නොතිබුණි.

(ඇ) පිටත්සර පර්යන්ත චාරිකා (outbound tours) ඇතුළත්ව දඹදිව චාරිකා විකුණුම් අඩුවීම හේතුකොට ගෙන විකුණුම් ආදායම අඩු වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 5.1 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඞී/12 හි 7.4.1 වගන්තියේ අවශ්‍යතාවය පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් පවත්වා නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

---------------------

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය මනා කළමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරූපනය විය.

## 6. පද්ධති හා පාලන

විගණනය කරගෙන යාමේදී අනාවරණය වූ පද්ධති හා පාලනවල අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
| --- | --- |
| (අ) පොත්පත්/ ලේඛන පවත්වා ගැනීම | එක් එක් ගනුදෙනුකරුගේ නමින් ලැබිය යුතු ශේෂය පවත්වා ගැනීම වෙනුවට ගනුදෙනුකරුවන් හසුරුවන සේවකයින්ගේ උපලේඛනයක් සමාගම විසින් නඩත්තු කර තිබුණි. |
| (ආ) ආදායම් හඳුනාගැනීම | (i) චාරිකා කටයුතුවලින් ගනුදෙනුකරුවන්ගේ අත්තිකාරම් ලැබීම හා ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල් අවලංගු කර තිබුණු අතර වර්ෂ 5 කට පසුව ගනුදෙනුකරුවන්ගෙන් තහවුරු කරගැනීමක් ලබා ගැනීමකින් තොරව ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.<br>(ii) ගනුදෙනුව නිමාවට පත්වීම පිළිබඳව සැලකිල්ලක් නොදක්වා ඉන්වොයිසිය නිකුත් කළ දිනයේදී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. |
| (ඇ) ඉන්වොයිස් කිරීම | (i) වරකට සමාගමෙන් වෙනස් වූ සේවාවන් ලබාගැනීමේදී සමාගම ඉන්වොයිස් දෙකක් හෝ දෙකකට වඩා වැඩි සංඛ්‍යාවක් එක ගනුදෙනුකරුවෙකුට නිකුත් කර තිබුණි.<br>(ii) මුදල් හා ණය ගනුදෙනු දෙකටම මුදල් ඉන්වොයිසි පමණක් නිකුත් කර තිබුණි. |
| (ඈ) වියදම් ප්‍රාග්ධනිත කිරීම | ප්‍රාග්ධනිත කළ යුතු වියදම් විධිමත්ව හඳුනාගෙන නොතිබුණි. |
| (ඉ) ගිණුම්කරණ පද්ධතිය | ගිණුම්කරණ පද්ධතියේ ගිණුම් සංකේත භාවිතා කර නොතිබුණි. |
| (ඊ) ජර්නල් සටහන් | ජර්නල් සටහන් යෙදීමේ ක්‍රියාවලියේදී බලතල බෙදාදීමක් ස්ථාපිත කර නොතිබුණි. |